Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පාඩම - 2.2. ආහාර කර්මාන්ත නගා සිටුවීම සඳහා ආහාර විවිධාංගීකරණයෙහි යෙදෙමු.**

**තාක්ෂණික ක්ෂේත්‍ර2-ආහාර**

**නිපුණතාව - 5.0 ආහාර මූලික කර ගත් කර්මාන්ත අවස්ථා හඳුනා ගනිමින් ව්‍යාrපාර සැලසුම් කරයි.**

**නිපුණතා මට්ටම - 5.3 ආහාර කර්මාන්තය නගා සිටුවීම සඳහා ආහාර විවිධාංගිකරණයෙහි යෙදෙයි.**

**ක්‍රිණයාකාරකම් සඳහා උපදෙස්**

- ආහාරයක් විවිධ මුහුණුවරින් පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කිරීම ආහාර විවිධාංගීකරණයයි.
- පහතින් දැක්වෙන දෙබස කියවන්න.

*අම්මා - දවල්ට තම්බපු මඤ්ඤොක්කා වලින් බාගයක්ම ඉතුරුයි. විසි කරන්නත් දුකයි.*
*දුව - කෑම විසිකරන එක අපරාදෙ අම්මෙ. අපි මෙවයින් අලුත් කෑමක් හදමුකො?*
*අම්මා - ඒක හොඳයි.. අපි මේ ටික පෙති කපලා වේලමු.*

- වේලාගත් මඤ්ඤොක්කා පෙති වලින් සවසට තේ බීමට සුදුසු ආහාරයක් සකසන්න. පවුලේ සියලු දෙනා එකතුව රස විඳින්න.
- ආහාරය රස විඳින අවස්ථාව ඡායාරූපයට හෝ චිත්‍ර යට නගන්න.

.

**ඉහත ක්‍රියයාකාරකම සඳහා උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක**

- 9 ශ්‍රේරේණිය පෙළ පොත - ඒකකය 2.2
- YOUTUBE - https://m.youtube.com/watch?v=7jDfIW4dJ70

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල**

- ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍යත උපකරණ හා ඇටවුම් නිර්මාණය කරයි.
- විවිධ ආහාර නිර්මාණ ඉදිරිපත් කිරීම මගින් පාරිභෝගික ආකර්ෂණය වැඩිදියුණු කිරීමට සැලසුම් කරයි.